මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **05**

**2023.01.05**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් - 2023

### රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම

පළාත් පාලන ආයතන 340 ක් (ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර) සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2023.01.04 දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව "ඡන්ද විමසීමේ කාල සීමාව" ලෙස සැලකේ. මෙම කාලසීමාව තුළ දී දේශපාලන පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කවල රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම්/ උසස් කිරීම්/ මාරු කිරීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ප්‍රමුඛ සියලුම නිලධාරීන් අවධානය යොමු කළ යුතු බව දන්වා සිටිමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිඑක්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථා අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට ඇත. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන එවැනි විධානයකට අනුකූලවීම සහ ක්‍රියාත්මක කිරීම තත් කාලයේ රජය සතු දේපල භාරව සිටින හෝ පාලනය දරන සියලුම නිලධාරීන් බැඳී සිටී. එවැනි විධානයක් උල්ලංඝණය කිරීම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූවිට වසර තුනක සිර දඬුවමක් හෝ රුපියල් ලක්ෂයක දඩයකින් හෝ එකී දඬුවම් ද්විත්වයම ලබාදීමට හැකි වරදක් බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම හඳුන්වා දී ඇති බව ද අවධාරණය කරමි.

මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2023.01.04 දිනැති අංක 2313/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් නිවේදනයක් හා EC/EDR/LAE/2023/04 B හා 2023.01.05 දිනැති අංක 20 දරන චක්‍රලේඛය නිකුත් කොට ඇති බැව් ද මෙයින් නිවේදනය කරමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්